# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,436—1958 ජූලි 25 වැනි සිකුරාදා—25.7.1958**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට අැලපෙන පරිද්දෙනි)**



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 655 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | 656 | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපළ විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 656 | මාර්ග කොම්පි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |



## පළාත් පාලන නිවේදන

### යටකලන් පත්තු ගම්කාර්‍ය සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (201 වැනි පරිච්ඡේදයේ) 22 වැනි වගන්තිය යටතේ විධිවූ බල මණ්ඩලය විසින් එනම් හලාවත දිස්ත්‍රික්කයේ යටකලන් පත්තු ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවැරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් ස්ථිර කරන ලද නියෝග.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ,
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 ජූලි 11 දින,
කොළඹ දීය.

### නියෝග

1. ආඥාපණතේ 21 වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කරන ලද මස් පිණිස සතුන් මරණ පොදු ස්ථානය සෞඛ්‍ය නිලධාරිතුමා භාරයේ තිබිය යුතුය. එහි මනා පරිපාලනය හා සනීපාරක්ෂාව සම්බන්ධයෙන් එකී නිලධාරියා විසින් වගකිය යුතුයි.

2. (1) කිසිම අයෙකු විසින් කිසිම සතෙකු—

(ඒ) ඒ සතා පරීක්ෂාකර බැලීම පිණිස සෞඛ්‍ය නිලධාරිතුමා විසින් බලය පවරන ලද නිලධාරිතුමා විසින් පරීක්ෂාකොට මිනිසුන්ට ආහාර පිණිස මරනුලැබීමට සුදුසුයයි අනුමතකර තිබේ නම්, හෝ

(බී) පූර්වභාග 8 ටත් 9 ටත් අතර කාලයේදී, හෝ මිස නැත්නම් සතුන් මරණ ස්ථානයේදී නොමැරිය යුතුයි. එහෙත් කවර අවස්ථාවකදී වුවත් මෙහි සඳහන් වේලාවට වඩා වෙනස් වූ යම් වේලාවක යම් සතෙකු මැරීම සඳහා ප්‍රධානතුමා විසින් බලය දිය හැකිසි.

(2) කිසිම අයකු විසින් කිසිම සතෙකු—

(ඒ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැ. 72 ක කාලයක් ගත වූවාට පසු කොයියම් වේලාවක, හෝ

(බී) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා සතුන් මරණ ස්ථානයට අයිති භූමියෙන් පණපිටින් ඉවත්කර ඇත්තේ නම්,

ඒ සතා නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ට ආහාර පිණිස මරණු ලැබීමට සුදුසුයයි ඒ ඡේදය යටතේ නැවතත් අනුමත කරන ලද්දේ නම් මිස නැත්නම් සතුන් මරණ ස්ථානයේදී නොමැරිය යුතුයි.

3. සතුන් මරණ ස්ථානයට යම් සතෙකු ගෙන එන සැම අයෙකු විසින්ම ඒ සතා සතුන් මරණ ස්ථානයට අයිති භූමියෙහි නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය වූ සැම පිළිවෙතක්ම යොදගත යුතුයි.

4. සතුන් මරණ ස්ථානයට යම් සතෙකු ගෙනඑන සැම අයෙකු විසින්ම ඒ සතා මරණු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂෙප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂෙප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමියෙන් ඉවත්කළ යුතුයි. නැතහොත් ඉවත් කරවිය යුතුයි.

5. යම් සතෙකු 2 වැනි නියෝගය යටතේ මරනු ලැබීමට සුදුසුයයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ට ආහාර පිණිස මැරීම නුසුදුසු බව පෙනී ගියොත් සෞඛ්‍ය නිලධාරිතුමා විසින් හෝ 2 වැනි නියෝගයේ සඳහන් නිලධාරිතුමා විසින් හෝ ඒ සතා මැරීම තහනම් කළ හැකිසි.

6. සතුන් මරණ ස්ථානයේදී මරණ ලද යම් සතෙකුගේ මස් හෝ අතුනු බහන් ආදිය සෞඛ්‍ය නිලධාරි තුමාගේ නොහොත් 2 වෙනි නියෝගයේ සඳහන්වූ නිලධාරිතුමාගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව හෝ තිබේනම් එතුමා විසින් ඒ මස් හෝ අතුනු බහන් ආදිය වහාම විනාශ කර දැමීමට හෝ ඉවත් කර දැමීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනු බහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම හෝ වළකින අන්දමින් ඉවත් කරවිය යුතුයි.

7. සතුන් මරණ ස්ථානය භාරවූ නිලධාරිතුමා විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 5 වෙනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ හෝ කිසිම සතෙකු මැරීමට අවසර නොදිය යුතුයි.

8. (1) කිසිම අයෙකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වෙනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනු බහන් ආදියක් සෞඛ්‍ය නිලධාරිතුමාගේ නොහොත් 2 වැනි නියෝගයේ සඳහන් වූ නිලධාරිතුමාගේ නියමය යටතේ මිස නැත්නම් සතුන් මරණ ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

(2) කිසිම අයකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතෙකුගේ කුණපය ඒ කුණපයේ ඉස්සරහ ගාත්වලත් පස්සා ගාත්වලත් සතුන් මරණ ස්ථානය භාරවූ නිලධාරිතුමා විසින් V. C. Yatakalanpattu යන මුද්‍රාව පිහිටුවා තිබේ නම් මිස නැත්නම් සතුන් මරණ ස්ථානයෙන් ඉවත් නොකළ යුතුයි.

9. අනිත් සතුන් ඉදිරියේදී හෝ ඒ ස්ථානයෙහි කලින් මරණ ලද යම් සතෙකුගේ කුණපය ඉවත් කර හෝ මුවාකර ස්ථානය ශුද්ධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතෙකු නොමැරිය යුතුයි.

10. වසංගත රෝගයකින්, සමේ රෝගයකින් හෝ බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ ළඟදී පෙළුනාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමෙහි යෙදී සිටියාවූ කිසිම කෙනෙකුට එකී රෝගය බෝවීමට හා රෝග බීජයන් මෝරනු ලැබීමට ගතවන කාල සීමාවන් පසුවනතුරු යම් සතුන් මරණ ස්ථානයක් භාරව සිටින අය විසින් එකී සතුන් මරණ ස්ථානයට ඇතුල්වීමට හෝ යම් සතෙකු මැරීමේ කටයුත්තකට සහභාගිවීමට හෝ ඉඩ නොදිය යුතුයි.

11. (1) සතුන් මරණ ස්ථානය පාවිච්චි කිරීම ගැන පහත සඳහන් වන අන්දමේ ගාස්තුවක් කාර්‍ය සභාවට කලින් ගෙවිය යුතුයි. ගාස්තුව ගෙවූ බවට සාක්කියක් වශයෙන් කාර්‍යාලයෙන් ලබා ගත් කුවිතාන්සියක් නැතුව කිසිම සතෙකු මැරීමට ඉඩ නොදිය යුතුයි.

| | රු. | ශ. |
|---|---|---|
| ගරකුන් සඳහා එකකුට ... ... | 1. | 00 |
| බැටළුවන්, එළුවන් හෝ ඌරන් සඳහා එකකුට ... | 0. | 50 |

(2) මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසුයයි 2 වෙනි නියෝගය යටතේ සතෙකු අනුමත කර තිබෙන විට ඒ සතා මස් මඩුවට ඇතුල් කිරීමට ප්‍රථමයෙන් ගාස්තු ගෙවූ බවට සාක්ෂියක් වශයෙන් කාර්ය සභා කාර්යාලයෙන් ලබාගත් කුවිතන්සියක් පෙන්වා සිටිම වුවමනා නොකෙරෙයි.

12. සතුන් මරණ ස්ථානය භාර අය විසින් සතුන් මරණ ස්ථානයට ගෙන එන සෑම සතෙකුගෙ රෙජිස්ටරයක් කාර්‍ය සභාව විසින් නියම කරන ෆෝර්මය පරිදි තබාගත යුතුය.

13. මේ නියෝගවල—

"ප්‍රධානතුමා" යනුවෙන් ගම්කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍ය සභාව" යනුවෙන් යටකලන්පත්තු ගම් ප්‍රදේශයේ ගම් කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"සෞඛ්‍ය නිලධාරිතුමා" යනුවෙන් සෞඛ්‍ය කටයුතු පිළිබඳ වෛද්‍ය නිලධාරිතුමා හෝ ප්‍රදේශයේ සෞඛ්‍ය කාර්‍යාලය භාර නිළ ධාරිතුමා හෝ සෞඛ්‍ය පරීක්‍ෂකතුමාද අදහස් කරනු ලැබේ;

"ආඥාපණත" යනුවෙන් මස් පිණිස සතුන් මැරීමේ ආඥාපණත (20 වැනි පරිච්ඡෙදය) අදහස් කරනු ලැබේ.

# තනතුරු — ඇබෑර්තු

## පළාත් පාලන සේවය

### මහරගම් උප නගර සභාවේ රාත්‍රි මුරකරුගේ ඇබෑර්තුව

ඉහත් සඳහන් ඇබෑර්තුව සඳහා මහරගම උප නගර සභාවේ සභාපතිතුමා විසින් ඉල්ලුම්පත්‍ර භාරගනු ලැබේ.

2. වාර්ෂික වැටුප් ක්‍රමය:—රුපියල් 540—22 × 12—රුපියල් 804.

වාර්ෂික වැටුප රුපියල් 636 දී සහ රුපියල් 732 දී දක්‍ෂතා කඩයිම සමර්ත විය යුතුයි.

3. සුදුසුකම්—

(අ) වයස:—11. 8. 58 දිනට අවුරුදු 25 ට වැඩි අවුරුදු 40 ට අඩුවිය යුතුයි.

(ආ) මනා ශරීරශක්තියකින් යුත් සිංහල හත්වන ප්‍රමාණය හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්වූ අය විය යුතුයි.

4. රජයේ ගැසට් පතෙහි 4 වෙනි කොටසේ ඉංග්‍රීසි කාංණ්ඩයේ මුල් පිටුවේ පත්වීම් සඳහා ප්‍රසිඩ කර ඇති සාමාන්‍ය කොන්දේසි වෙත අයදුම්කරුගේ ආවධානය යොමුකරවනු ලැබේ.

5. පලාත් පාලන ගැසට් පතෙහි සඳහන් ආකෘති ඉල්ලුම් පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත්‍ර 1958 අගෝස්තු මස 11 වෙනි දින සවස 4 ට පෙර මාවෙත ලැබෙනසේ එවිය යුතුයි. ඊට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

6. සෑම ඉල්ලුම් පත්‍රයක්ම ලැබුණු බව දන්වා එවනු ලැබේ. 1958. 8. 15 දිනට පෙර එසේ දැන්වීමක් නොලැබුනොත් ඒ බව මහරගම උප නගර සභාවේ සභාපතිතුමා වෙත වහාම දැන්විය යුතුයි. එසේ නොකිරීම ඉල්ලුම් පත්‍රය ගැන සලකා නොබැලීමට හේතුවක් වෙනවා ඇත.

ඩී. ඇල්. පතිරගේ,
සභාපති,
මහරගම උප නගර සභාව.

මහරගම උප නගර සභා කාර්‍යාලය,
601, පරණ පාර, නාවින්න,
නුගේගොඩ. 14. 7. 58.

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී.—ජී.ඕ. 14/43.

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡෙදයේ) 49 වැනි වගන්තිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආණමඩුව ගම් ප්‍රදේශයේ ගම් කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශණයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරණ ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ,
අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 ජූලි 11 දින,
කොළඹ දිය.

### අන්තරායදායක වූ හා අප්‍රසන්න වූ කර්මාන්ත පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථා

1. පහත දක්වෙන කර්මාන්ත අප්‍රසන්න වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
(2) තොග ගණනේ විකිණීම පිණිස නරක්විය හැකි ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
(3) කොම්පෝස්ට් හෝ කෘතිම පොහොර සෑදීම.
(4) විනාකිරි සෑදීම.
(5) සබන් සෑදීම.
(6) දුම්කොල වියලා සකස්කිරීම.
(7) හම් පදම්කරන ස්ථානයක් තබා ගැණීම.
(8) පුවක් වියලා සකස්කිරීම.
(9) සතුන් ගේ ලේ හෝ මලකුණු හෝ උණු කිරීම.
(10) සතුන්ගේ හම් හෝ ඇටකටු හෝ ගබඩා කිරීම.
(11) රබර් ෂීට් හෝ ක්‍රේප් රබර් දුම් ගැස්සවීම හෝ සෑදීම.
(12) කෘතිම පොහොර හෝ කෘතිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
(13) සෝඩා සෑදීම.
(14) ලෑලි පොගොවා සකස්කිරීම.
(15) පොල්ලෙලි පෙඟවීම සඳහා පොල්ලෙලි වළවල් තබා ගැණීම.
(16) මාලු අයිස් දැමීම.
(17) සුරුට්ටු, සිගරැට් හෝ බීඩි සෑදීම.
(18) රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම.
(19) පැණි හෝ හකුරු සෑදීම.
(20) රබර් වියලීම හෝ සෑදීම.

2. පහත සඳහන් අන්තරාදායක වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) සෝඩා ලැමනේඩ් ආදී සිසිල් බීම වර්ග සෑදීම.
(2) කොප්පරා සෑදීම.
(3) තෙල් වලින් හෝ වාෂ්ප බලයෙන් හෝ පැට්රල් ආදී දැවෙන ද්‍රව්‍යවලින් හෝ ඉලෙක්ට්‍රික් බලයෙන් හෝ ක්‍රියාකාරණ යන්ත්‍ර පාවිච්චි කරණ යම් කර්මාන්තයක් කරගෙන යාම.
(4) කබුක් ගල්, බොරළු හෝ කලුගල් ලබා ගැනීමට වළවල් කැණීම.
(5) මිනිරන් වියලීම හෝ ගබඩා කිරීම.
(6) වළක් කැණීමෙන් හුණුගල් ලබාගැණීම.
(7) හාල් හෝ වී මෝලක් තබා ගැනීම.
(8) යන්ත්‍ර සූත්‍ර ආදියෙන් පොල්තෙල් සිඳීම.
(9) සෙක්කුවකින් පොල්තෙල් සිඳීම.
(10) දර හෝ ලී මඩුවක් තබා ගැනීම.
(11) කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම.
(12) කපු පුලුන් හෝ පිදුරු ගබඩා කිරීම.
(13) බූමිතෙල් ගබඩාවක් තබා ගැනීම.
(14) මුද්‍රණාලයක් තබාගැණීම.
(15) කපාපු පොල් සකස් කිරීම.
(16) සවර්ණාභරණ සෑදීම.
(17) අම්ලකර වායුව පාවිච්චි කරණ ලෝකුරු වැඩ කිරීම.
(18) අම්ලකර වායුව පාවිච්චි කරණ ගරාජයක් තබාගැණීම.
(19) පැගිරි තෙල් හෝ කුරුඳු තෙල් සිඳීම.
(20) ගිණිකූරු සෑදීම.
(21) කෝප්පරා ගබඩා කිරීම.
(22) පොල් කටු අගුරු ගබඩා කිරීම.
(23) කම්මලක් තබා ගැනීම.
(24) වඩුමඩුවක් තබා ගැනීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්න වූ හා අන්තරායදායක වූ කර්මාන්ත වශයෙන් සලකනු ලැබේ:—

(1) කෙඳි වර්ග සායම් කිරීම.
(2) ගඩොල් හෝ උලු පිච්චීම.
(3) බැටරි චාජ් කිරීම.
(4) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස්කිරීම හෝ කැබලි කිරීම.
(5) අගුරු සඳහා පොල් කටු පිලිස්සීම.

---

ඇල්. ඩී.—බී. 160/41.
ඇල්.ජී.ඩී—ජී ඒ 11/36/3

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ බදුළු දිස්ත්‍රික්කයේ බින්තැන්න ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ,
අමාත්‍ය කාර්‍ය්‍යාංශයේ ස්ථාවර ලෙකම්තැන.

1958 ජූලි මස 7 වැනි දින,
කොළඹදීය.

## අතුරු ව්‍යවස්ථා

1. කාර්‍ය්‍යසභාව විසින් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල xi වැනි කාණ්ඩයේ වූ බත් කඩ, රෙස්ටෝරන්ට් ශාලා, හා තේ හා කෝපි කඩ සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා, එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව එක්කම ඊළඟට පහත දැක්වෙන අළුත් අතුරු ව්‍යස්ථාව යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1" ඒ (1) ඒ සඳහා ප්‍රධානතුමා විසින් නිකුත්කරන ලද විශෙෂ බලපත්‍රයක බලය යටතේ මිස නැත්නම්, කිසිවකු විසින් ඕනෑම ආගමික උත්සවයක් පවත්නා කාලයක් ඇතුලත බත්කඩයක්, රෙස්ටොරන්ට් ශාලාවක්, හෝ තේ හා කෝපි කඩයක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම හෝ නොකළ යුතුයි.

එහෙත්, එබඳු උත්සවයක් පවත්වනු ලබන අවුරුද්ද සම්බන්ධයෙන් 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර යක් නිකුත්කරන ලද යම් බත්කඩයක්, රෙස්ටෝරන්ට් ශාලාවක් හෝ තේ හා කෝපි කඩයක් සඳහා එබඳු බලපත්‍රයක් අවශ්‍ය නොවන්නේ ය.

(2) 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සිට 9 වැනි අතුරු ව්‍යවස්ථාව දක්වාවූ (දෙකම ඇතුළුව) අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන (1) වැනි ඡෙදය යටතේ නිකුත්කරන ලද බලපත්‍රයක් දරණ සෑම කෙනෙකු සම්බන්ධයෙන් අදාල වන පරිද්දෙන්ම බලපත්‍රයක් නිකුත් කරන ලද කිසියම් බත්කඩයක් රෙස්ටෝරන්ට් ශාලාවක් හෝ තේ හා කෝපි කඩයක් සම්බන්ධයෙන්ද ඒ ඒ කාරණයේ හැටියට අදාල වන්නේ ය.

2. කාර්‍ය්‍යසභාව විසින් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල xvi වැනි කාණ්ඩයේ වූ පළතුරු හා එළවළු කඩ සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා, එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව එක්කම ඊළඟට පහත දැක්වෙන අළුත් අතුරු ව්‍යවස්ථාව යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"1" ඒ (1) ඒ සඳහා ප්‍රධානතුමා විසින් නිකුත් කරන ලද විශෙෂ බලපත්‍රයක බලය යටතේ මිස නැත්නම්, කිසිවකු විසින් ගම් ප්‍රදෙශය ඇතුලත ඕනෑම ආගමික උත්සවයක් පවත්නා කාලයක් ඇතුලත අළුත් පළතුරු හෝ එළවළු කඩයක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම හෝ නොකළයුතුයි.

එහෙත්, එබඳු උත්සවයක් පවත්වනු ලබන අවුරුද්ද සම්බන්ධයෙන් 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කරන ලද යම් පළතුරු හෝ එළවළු කඩයක් සඳහා එබඳු බලපත්‍රයක් අවශ්‍ය නොවන්නේ ය.

(2) 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ (එෆ්), (එච්) හා (අයි) දරන ඡේදවල විධිවිධාන හා 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන, එබඳු බලපත්‍රයක් දරන සෑම කෙනෙකු සම්බන්ධයෙන් අදාලවන පරිද්දෙන්ම එබඳු බලපත්‍රයක් නිකුත් කරන ලද. පළතුරු හෝ එළවලු කඩ සම්බන්ධයෙන්ද ඒ ඒ කාරණයේ හැටියට අදාල වන්නේ ය.

---

## සංශොධනයයි

### ගම්සභා ආඥාපනත

පන්නල ගම්කාර්‍ය්‍ය සභාව විසින් සම්පාදිත රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සඳහා අතුරු ව්‍යවස්ථා

1958 ජූනි 27 වැනි දින අංක 11,398 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රිකාවේ IV වැනි කාණ්ඩයේ 569 වැනි පිටුවේ පළකරන ලද ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථා කෙළවර දැක්වෙන "බී" පෝරමය පහත සඳහන් අයුරු සංශොධනය වියයුතුයි:—

"බී" පෝර්මය

| | |
|---|---|
| අත්කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂා රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... ... | 1. ප. |
| සෑම ගොන් දෙන්නා බඳින බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 2. ප. |
| සෑම තනිගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 3. ප. |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 4. ප. |
| සෑම අත්කරත්යක් සඳහා ... ... | 5. ප. |
| සෑම බයිසිකලයක් සඳහා ... ... | 6. ප. |

---

## විශෙෂ නිවේදනයයි

**1958 ජූලි 29 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 අගෝස්තු 1 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන 1958 ජූලි 28වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.**

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1958 ජූලි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.